කාර්යසාධන වාර්තාව
செயலாற்றல் அறிக்கை
# Performance Report 2016



කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය
மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு மற்றும் சமூக அபிவிருத்தி அமைச்சு
**Ministry of Hill Country New Villages, Infrastructure and Community Development**

# කාර්යසාධන වාර්තාව
# செயலாற்றல் அறிக்கை
# Performance Report

# 2016

කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு மற்றும் சமூக அபிவிருத்தி அமைச்சு

**Ministry of Hill Country New Villages, Infrastructure and Community Development**

කාර්යසාධන වාර්තාව - 2016
செயலாற்றல் அறிக்கை - 2016
**Performance Report - 2016**

කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය
மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு மற்றும் சமூக அபிவிருத்தி அமைச்சு
Ministry of Hill Country New Villages, Infrastructure and Community Development

P.O. Box 562, No. 45, St. Michale's Road, Colombo 03.
Tel: 0112 541 369 Fax : 0112 328 117
Email : smpid@sltnet.lk / mhplanning2016@gmail.com
Web site www.mpid.gov.lk

# කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

# කාර්යසාධන වාර්තාව 2016



# දැක්ම

වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රජාව,
අන් ජන කොටස් හා සමාන සමාජ තත්ත්වයකින්,
ආත්ම ගෞරවයකින් හා අභිමානයකින් හෙබි
ග්‍රාමීය ප්‍රජාවක් ලෙස පරිණාමනය කිරීම.

# මෙහෙවර

වැවිලි අංශයේ ජනතාවගේ
සුභසාධනය,
ඔවුන්ගේ වාසස්ථාන,
ජීවන තත්ත්වය හා
සමාජ ආර්ථික පහසුකම් වැඩි දියුණු කිරීම තුළින්
ප්‍රවර්ධනය කිරීම.



# පටුන

පිටුව


1. හැඳින්වීම 8-9
2. අමාත්‍යාංශය ස්ථාපිත කිරීම 10
3. අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරය 10
4. අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය හා තත්‍ය කාර්ය මණ්ඩලය 11-12
5. අමාත්‍යාංශයේ සංවර්ධන ප්‍රවේශය හා ප්‍රමුඛතා 13
   5.1 සංවර්ධන ප්‍රවේශය 13
   5.2 අමාත්‍යාංශයේ ප්‍රමුඛතා 13-14
6. සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය හා ආයතනික ව්‍යුහය 15
   6.1 ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය 15
   6.2 ආයතනික ව්‍යුහය 16
7. අමාත්‍යාංශයේ වියදම් සාරාංශය 17
8. සංවර්ධන වැඩසටහන් හා ප්‍රගතිය 18
   8.1 වැවිලි ප්‍රජාවගේ සමාජ, ආර්ථික සංවර්ධනය උදෙසා වන පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2016 - 2020) 18-23
   8.2 කඳුරට නව ගම්මාන සඳහා නිවාස 24-33
   8.3 පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධනය 33-40
   8.4 ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් 41-44
9. අමාත්‍යාංශය විසින් 2016 වසරේ අත්පත් කර ගන්නා ලද විශේෂ ජයග්‍රහණ 45-46
10. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 47
   10.1 වැවිලි මානව සංවර්ධන භාරය 47-52
   10.2 සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම යටතේ පැවති ආයතන 53-56
      10.2.1 හැටන් - පුල් බැන්ක් හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය
      10.2.2 ප්‍රජාශක්ති (ඊ- කියෝස්ක්) මධ්‍යස්ථාන
      10.2.3 තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය - රම්බොඩ
      10.2.4 නෝර්වුඩ් ක්‍රීඩා සංකීර්ණය





"ඉතා කෙටි කාලයක් තුළ මෙම සමාජ පරිවර්තනය හා ප්‍රජාව සවිබල ගැන්වීම යන කරුණු සම්පූර්ණ කළ නොහැක. මෙය එක්තරා අඛණ්ඩ ක්‍රියාදාමයකි. මෙම අමාත්‍යාංශය විසින් ක්‍රියාවට නංවනු ලබන වැඩසටහන් හා ව්‍යාපෘතීන් මෙන්ම ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් හා ව්‍යාපෘතීන් ද මෙම ක්‍රියාවලිය ශක්තිමත් කරන අතර, එය මෙම සමාජය තුළ පවතින අවම සමාජ තත්ත්වයන් මුලිනුපුටා දැමීම තෙක් ක්‍රියාත්මක වනු ඇත."

මිලියනයකට අධික ජන සංඛ්‍යාවක් නියෝජනය කරන්නා වූ ද, රටේ ජාතික ආදායමට විශාල දායකත්වයක් සපයන්නා වූ ද වැවිලි ප්‍රජාව මෙතෙක් මුහුණ දුන් සමාජ විෂමතාවන් තුරන් කොට අන් ජන කොටස් හා සමාන සමාජ තත්ත්වයකින්, ආත්ම ගෞරවයකින් හා අභිමානයකින් හෙබි ග්‍රාමීය ප්‍රජාවක් ලෙස පරිණාමනය කිරීමේ අදිටනින්, නව ප්‍රවේශයකින්, නව රජයේ ආරම්භයත් සමග, 2015.09.21 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 1933/13 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින්,
කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවන ලදී.

# 1. හැඳින්වීම

ශතවර්ෂ දෙකකට ආසන්න ඉතිහාසයකට උරුමකම් කියනු ලබන ශ්‍රී ලංකාවේ වැවිලි ප්‍රජාවගේ මූලාරම්භය, මෙරට බ්‍රිතාන්‍යයේ යටත් විජිත යුගයක්ව පැවති සමය දක්වා දිව යයි. බ්‍රිතාන්‍යයන් විසින් වර්ෂ 1840 දී කඳුකරයේ කෝපි වගා කිරීම සඳහා, කම්කරුවන් ලෙස දකුණු ඉන්දියාවෙන් ගෙන්වා ගනු ලැබූ මෙම ජන කොට්ඨාශය, කෝපි වගාව විනාශ වීමෙන් අනතුරුව ඇති කළ තේ හා රබර් වගාවන් කේන්ද්‍ර කර ගනිමින් සුවිශේෂී හුදකලා ජන කොටසක් ලෙස වර්ධනය වී ඇත.

ලයින් කාමර හෙවත් පේළි නිවාස සිය වාසස්ථාන කොට ගනිමින්, ඉතා දිළිඳු කම්කරු ජීවන රටාවකට හිමිකම් කියන මොවුන්, මානව සංවර්ධන දර්ශක (නාගරික හා ග්‍රාමීය) හා සැසඳීමේදී, අන් ජන කොටස්වලට සාපේක්ෂව කැපී පෙනෙන සමාජ විෂමතාවකට ලක්ව ඇති බව පෙනී යයි.

වතු ආශ්‍රිත ජනතාවගේ සමාජ තත්ත්වය පිළිබිඹු කෙරෙන සංඛ්‍යාලේඛන

| දර්ශකය - දරිද්‍රතාව හා මානව වාසස්ථාන | ජාතික | නාගරික | ග්‍රාමීය | වතු |
|---|---|---|---|---|
| දරිද්‍රතා ඒක ශීර්ෂ අනුපාතය (HIES 2013) | 6.7 | 2.1 | 7.6 | 10.9 |
| සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය සපයා ගැනීම (HIES 2013) | 89.7 | 98.9 | 90.9 | 52.4 |
| අර්ධ ස්ථිර නිවාස % (HIES 2013) | 17.8 | 7.4 | 16.9 | 76.1 |
| සාක්ෂරතා අනුපාතය % (HIES 2013) | 95.7 | | | 86.1 |
| දියුණු සනීපාරක්ෂක ක්‍රම සලසා ගැනීමට යොමුවූ පවුල් % (2012/2013) | 87.2 | | | 73.3 |
| ස්ථාපිත ජාතික භෞතික ප්‍රමිතීන්ට සරිලන සේ පිහිටුවා ඇති පූර්ව ළමාරක්ෂක මධ්‍යස්ථාන % | 50.7 | | | 24 (සියලු වතු) 64 (ප්‍රා.වැ.ස.වතු) |



වැවිලි ප්‍රජාවගේ සමාජ සංවර්ධන තත්ත්වය පිළිඹිබු කෙරෙන සංඛ්‍යාලේඛන

| දර්ශකය - සෞඛ්‍ය හා පෝෂණය | ජාතික | නාගරික | ග්‍රාමීය | වතු |
|---|---|---|---|---|
| නව උපත් මරණ අනුපාතය % (උපත් 1000 කට) | 11 | 6.0 | 15.0 | 18.0 |
| ළදරු මරණ අනුපාතය % (උපත් 1000 කට) | 9.7 | 10.0 | 19.0 | 29.0 |
| වයස අවුරුදු 5ට අඩු ළමුන් හා ප්‍රජනන වියේ පසුවන කාන්තාවන් අතර රක්තහීනතාව % | 20% (යුනිසෙෆ් 2012) | | | 61% (යුනිසෙෆ් 2012) |
| වයස අවුරුදු 5 ට අඩු මන්දගාමීව වැඩෙන ළමුන්ගේ අනුපාතය | 18 | 13.8 | 16.2 | 40.2 |
| වයස අවුරුදු 5 ට අඩු, අඩු බරැති ළමුන්ගේ අනුපාතය % | 21.8 | 16.5 | 21.2 | 30.1 |
| අඩු බර උපත් (කි.ග්‍රෑම්. 2.5 අඩු) | 16.6 | 12.8 | 16.4 | 31.0 |
| වයස අවුරුදු 5 ට අඩු, උසට සරිලන අඩු බරැති ළමුන් | 14.7 | | | 16.4 |

මූලාශ්‍රය : ජනගහන සෞඛ්‍ය සමීක්ෂණය (DHS) 2006/07 හා ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය (HIES) 2012/13



## 2. අමාත්‍යාංශය ස්ථාපිත කිරීම

මිලියනයකට අධික ජන සංඛ්‍යාවක් නියෝජනය කරන්නා වූ ද, රටේ ජාතික ආදායමට විශාල දායකත්වයක් සපයන්නා වූ ද වැවිලි ප්‍රජාව මෙතෙක් මුහුණ දුන් සමාජ විෂමතාවයන් තුරන් කොට අන් ජන කොටස් හා සමාන සමාජ තත්ත්වයකින්, ආත්ම ගෞරවයකින් හා අභිමානයකින් හෙබි ග්‍රාමීය ප්‍රජාවක් ලෙස පරිණාමනය කිරීමේ අදිටනින්, නව ප්‍රවේශයකින්, නව රජයේ ආරම්භයත් සමග, 2015.09.21 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 1933/13 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින්, කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවන ලදී.

## 3. අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරය

3.1. රජයේ හා පෞද්ගලික වැවිලි සමාගම්වල සේවය කරන ඉඩම් අහිමි පේළි නිවාසවල ජීවත්වන ජනතාව සඳහා නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම උදෙසා නව ගම්මාන / නගර නිර්මාණය කිරීම.

3.2. වතු අංශයේ ප්‍රජාවන් සවිබල ගැන්වීම සඳහා ජීවනෝපාය උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

3.3. වැවිලි ප්‍රජාව ආර්ථිකව, සාමාජීයව හා සංස්කෘතිකමය වශයෙන් නඟාසිටුවීම සඳහා මූලික පහසුකම් ඇතුළු අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කිරීමට පියවර ගැනීම.

3.4. ග්‍රාමීය වතු අංශයන්හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.



## 4. අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය හා තත්‍ය කාර්ය මණ්ඩලය

### 4.1 සංවිධාන ව්‍යුහය



### අමාත්‍යාංශයේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල ( 2016 දෙසැම්බර් 31 දිනට)

| අනු අංකය | තනතුර | සේවය | අනුමත කාර්ය මණ්ඩල | තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| 1. | ලේකම් | | 1 | 1 |
| 2. | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ප.සේවය | 2 | 2 |
| 3. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේවය | 1 | 1 |
| 4. | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේවය | 1 | 1 |
| 5. | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍රි.සේවය | 1 | 1 |
| 6. | අධ්‍යක්ෂ | ශ්‍රී ලං.ඉ.සේ. | 1 | 0 |
| 7. | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේවය | 1 | 1 |
| 8. | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේවය | 1 | 1 |
| 9. | සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේවය | 2 | 1 |
| 10. | සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍රි.සේවය | 2 | 2 |
| 11. | සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ඉ.සේවය | 1 | 1 |
| 12. | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේවය | 1 | 1 |
| 13. | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේවය | 1 | 0 |
| 14. | පරිපාලන නිලධාරී | රා.කළ.සහ.සේවය | 1 | 1 |
| 15. | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | 2 | 0 |
| 16. | තාක්ෂණ නිලධාරී | ශ්‍රී.ලං.තා.සේවය | 3 | 0 |
| 17. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී.ලං.තො. හා සං.තා.සේවය | 1 | 0 |
| 18. | ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | 1 | 1 |
| 19. | සංඛ්‍යා ලේඛන නිලධාරී | | 1 | 0 |
| 20. | සංවර්ධන නිලධාරී | සං.නිල.සේ. | 14 | 14 |
| 21. | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.කළ.සහ.සේවය | 20 | 12 |
| 22. | වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා | අමාත්‍යාංශගත | 255 | 183 |
| 23. | ඡායාරූප ශිල්පි | තාවකාලික | 1 | 1 |
| 24. | කැමරා ශිල්පී | තාවකාලික | 1 | 1 |
| 25. | සහයක ඡායාරූප ශිල්පී | තාවකාලික | 1 | 1 |
| 26. | රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය | 12 | 12 |
| 27. | කාර්යාල කාර්ය සහායක | කා.සේ.සේවය | 13 | 7 |
| | එකතුව | | 342 | 246 |



# 5. අමාත්‍යාංශයේ සංවර්ධන ප්‍රවේශය හා ප්‍රමුඛතා

## 5.1. සංවර්ධන ප්‍රවේශය

දිවයිනේ මධ්‍යම, ඌව, සබරගමුව, බස්නාහිර, වයඹ හා දකුණු පළාත් වල ඇතැම් ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් තේ හා රබර් වතු ප්‍රදේශ ආශ්‍රිතව ජීවත් වන පවුල් 2,50,000ක පමණ (මිලියනයකට අධික ජනගහණයක් ඇති) වතු ජනතාවගේ සමාජ, ආර්ථික සංවර්ධනය නිසි දිශානතියක් ඔස්සේ හා මනා අධීක්ෂණයකින් යුතුව සිදු කිරීම සඳහා සකසා ඇති පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2016-2020) දියත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

වැවිලි ප්‍රජාවගේ සමාජ, ආර්ථික සංවර්ධනය සඳහා වන මෙම ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ පුළුල් ප්‍රචාරයක් ලබා දෙමින්, එමගින් ප්‍රමුඛතාව ලබා දී ඇති ක්ෂේත්‍රයන් නියෝජනය කරනු ලබන අනෙකුත් රේඛීය අමාත්‍යාංශ, පළාත් අමාත්‍යාංශ ඇතුළු සියලුම ආයතනයන්හි පූර්ණ දායකත්වය ලබාගනිමින් වැවිලි ප්‍රජාවගේ සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාදාමය ශක්තිමත් කිරීමේ නව සංවර්ධන ප්‍රවේශයකට අමාත්‍යාංශය අවතීර්ණ වී ඇත. ඒ සඳහා, අදාල සියලු පාර්ශවයන් සම්බන්ධීකරණය, අධීක්ෂණය හා මෙහෙයවීම මෙම අමාත්‍යාංශය මගින් සිදුකරමින් පවතී.

## 5.2. අමාත්‍යාංශයේ ප්‍රමුඛතා

ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි අන්තර්ගත කර ඇති වතු නිවාස ඉදිකිරීම, සමාජ ආර්ථික සංවර්ධනය සඳහා අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා වතු ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීම මෙම අමාත්‍යාංශයේ ප්‍රමුඛ කාර්යභාරයන් වේ.





කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය




# 6. සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය හා ආයතනික ව්‍යුහය

## 6.1. ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය

අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්ය භාරය මූලික වශයෙන් අමාත්‍යාංශ විෂය යටතේ ඇති ආයතනයන් වන වැවිලි මානව සංවර්ධන භාරය, තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, ප්‍රජා ශක්ති මධ්‍යස්ථාන, දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා ප්‍රාදේශීය සභා හරහා සිදු කරයි.

### සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනික ව්‍යුහය

| ප්‍රමුඛතා ක්ෂේත්‍රය | ක්‍රියාත්මක කරනු ලබන ආයතන |
|---|---|
| (1) වතු නිවාස සංවර්ධනය | |
| (i) හරිත රන් නිවාස | වැවිලි මානව සංවර්ධන භාරය (PHDT) |
| (ii) ඉන්දියානු ආධාර සහිත නිවාස | UN HABITAT, ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, වැවිලි මානව සංවර්ධන භාරය |
| (2) පසුගාමී ප්‍රදේශයන්හි සමාජ ආර්ථික සංවර්ධනය | |
| (i) පේළි නිවාසවල වහල සෙවිලි කිරීම | වැවිලි මානව සංවර්ධන භාරය |
| (ii) පානීය ජලය සැපයීම | ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය සභා, වැවිලි මානව සංවර්ධන භාරය |
| (iii) සනීපාරක්ෂක පහසුකම් සැපයීම | |
| (iv) ළමා සංවර්ධන මධ්‍යස්ථාන ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය (ප්‍රවේශ මාර්ග / විදුලි) | |
| (3) ජීවනෝපාය සංවර්ධනය | |
| (i) නිපුණතා සංවර්ධනය හා වෘත්තීය පුහුණුව | තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, ප්‍රජා ශක්ති මධ්‍යස්ථාන |
| (ii) ප්‍රජා සවිබල ගැන්වීම | ප්‍රජාශක්ති ව්‍යාපෘතිය හා චක්‍රීය අරමුදල් මගින් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල/දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කර ඇති වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නන් මගින්. |
| (iii) සෞඛ්‍ය හා පෝෂණය | |

# 6.2. ආයතනික ව්‍යුහය




# 7. අමාත්‍යාංශයේ වියදම් සාරාංශය

## 2016.01.01 - 2016.12.31 දක්වා

## අමාත්‍යාංශයේ වියදම් සාරාංශය

| කාණ්ඩය/ වැඩසටහන/ ව්‍යාපෘතිය | 2016 සඳහා ප්‍රතිපාදන රු : ('000) | 2016/12/31 දිනට වියදම රු : ('000) | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|
| **පුනරාවර්තන** | **223,421** | **189,124** | **84.65** |
| පුද්ගල පඩිනඩි | 153,850 | 126,796 | 82.42 |
| සාමාන්‍ය පරිපාලනය | 69,571 | 62,328 | 89.59 |
| | | | |
| **ප්‍රාග්ධන** | **1,573,580** | **1,094,971** | **69.58** |
| සාමාන්‍ය පරිපාලනය | 55,580 | 53,572 | 96.39 |
| | | | |
| **** සංවර්ධන වැඩසටහන්** | **1,518,000** | **1,041,399** | **68.6** |
| අ. කඳුරට නව ගම්මාන සඳහා නිවාස | 1,200,000 | 726,429 | 61 |
| ආ. පසුගාමී ප්‍රදේශවල, සමාජ ආර්ථික සංවර්ධනය | 200,000 | 199,997 | 100 |
| ඇ. ජීවනෝපාය හා මූලික පහසුකම් වැඩි දියුණු කිරීම | 118,000 | 114,973 | 97 |
| | | | |
| **මුළු එකතුව** | **1,797,001** | **1,284,095** | **71.46** |

## සංවර්ධන වැඩසටහන් හි මූල්‍ය ප්‍රගතිය



# 8. සංවර්ධන වැඩසටහන් හා ප්‍රගතිය

## 8.1. වැවිලි ප්‍රජාවගේ සමාජ, ආර්ථික සංවර්ධනය උදෙසා වන පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2016 - 2020)

වැවිලි ප්‍රජාවගේ දිළිඳු බව හා තීරණාත්මක වශයෙන් බැඳී පවතින සෞඛ්‍ය හා පෝෂණය, අධ්‍යාපනය හා මුල් ළමා විය සංවර්ධනය, නිපුණතා සංවර්ධනය හා වෘත්තීය පුහුණුව, කාන්තාවන් හා තරුණයන් සවිබල ගැන්වීම, නිවාස, පානීය ජලය, සනීපාරක්ෂාව ඇතුළු මූලික යටිතල පහසුකම් සංවර්ධනය හා යහ පාලනය යන ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කරමින්, ඊට අදාලව මතු වී ඇති ගැටළු නිරාකරණය කොට වැවිලි ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම උදෙසා ජාතික මට්ටමකින් ක්‍රියාත්මක වනු පිණිස අදාල සියලුම පාර්ශවයන්ගේ පූර්ණ දායකත්වය ලබා ගැනීම මෙම පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි මූලික පරමාර්ථය වේ.

මෙම ජාතික සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇති සියලු පාර්ශවයන් සම්බන්ධීකරණය, මෙහෙයවීම හා ඇගයීම මෙම අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන අතර, එහි ප්‍රගතිය ත්‍රෛමාසිකව අධීක්ෂණය කිරීමේ වගකීම පැවරී ඇත්තේ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙතයි. එමෙන්ම, ජාතික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ දැනුවත් කිරීම, සුදුසු ව්‍යාපෘති යෝජනා ලබා ගැනීම හා ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දේශීය - විදේශීය අරමුදල් සම්පාදනය කර ගැනීමට කටයුතු කිරීම ද මෙම අමාත්‍යාංශයේ කර්තව්‍යයන් යටතට ගැනේ.







### 8.1.1. ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය

අ. ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස්කොට ගරු අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා දෙස් විදෙස් නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් 2016.03.10 දින බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී මුද්‍රණ ද්වාරයෙන් එළි දැක්වීම.

ආ. ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි මුද්‍රිත පිටපත් භාෂා ත්‍රිත්වයෙන් මුද්‍රණය කොට අදාල පාර්ශ්වයන් වෙත ලබා දීම හා අමාත්‍යාංශ වෙබ් අඩවියට ඇතුළත් කිරීමට කටයුතු කිරීම.

ඇ. ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයන් සකස් කිරීම, ඊට අදාල ගැටළු, අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරීම හා ක්‍රියාත්මක කළ යුතු විශේෂ යෝජනා / ව්‍යාපෘති පිළිබඳව විද්වතුන්, අමාත්‍යාංශ නිලධාරීන් හා ජනතා නියෝජිතයන් සමග සාකච්ඡා පැවැත්වීම හා ඔවුන්ගේ සහාය ලබා ගැනීම. (Think Tank Meeting)

ඈ. ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා ලබා දීම, අය වැය ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම, ආයතනික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම පිළිබඳව රේඛීය අමාත්‍යාංශය හා පළාත් අමාත්‍යාංශ ඇතුළු අනෙකුත් ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීම සඳහා ප්‍රාදේශීය වැඩමුළු පැවැත්වීම.

ඉ. එම වැඩමුළු පැවැත්වීමේ ප්‍රතිඵලයක් ලෙස ජාතික ක්‍රියාකාරී සැලැස්මේ තෝරාගත් ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම සඳහා අදාල රේඛීය අමාත්‍යාංශ එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කිරීම.

ඊ. මෙම සැලැස්ම ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කොට ඇති වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සපයන්නන්ගේ (PCCF) දායකත්වය ලබා ගැනීම සඳහා පුහුණු වැඩසටහන් තුනක් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් ක්‍රියාත්මක කිරීම.








ජාතික ක්‍රියාකරි සැලැස්ම ගරු අග්‍රාමාත්‍යතුමා වෙත පිළිගැන්වීම 2016.03.10



ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍යාංශයේදී පවත්වන ලද වැඩිලි
ප්‍රජා පහසුකම් සලසන නිලධාරීන් (PCCF) දැනුවත් කිරීමේ වැඩසටහන - 2016.09.27







ජාතික ක්‍රියාකාරි සැලැස්ම පිළිබඳව ඇමරිකා
එක්සත් ජනපදයේ තානාපතිතුමා සමඟ
පැවති සාකච්ඡාව

ජාතික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව
අමාත්‍යාංශය විසින් සකස් කරන ලද වාර්තාමය චිත්‍රපටය





කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය



අනෙකුත් ප්‍රජාවන් හා සමාන වූ අභිමානයකින් යුතුව ජීවත්වීමේ අයිතිය වැවිලි ප්‍රජාව වෙත ද හිමිකර දීමේ අභිලාශයෙන්, රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් මත පදනම්ව පර්චස් 07 ක ඉඩකඩක වර්ග අඩි 550 ක වපසරියකින් යුතු පානීය ජලය හා සනීපාරක්ෂක පහසුකම් සහිත "තනි ඒකක" නිවාස ලබා දීමේ ව්‍යාපෘතිය මෙම අමාත්‍යාංශය විසින් 2015 වසරේදී ආරම්භ කොට ක්‍රියාත්මක කරමින් පවතී.

## 8.2 කඳුරට නව ගම්මාන සඳහා නිවාස

වාසස්ථාන සම්බන්ධයෙන් වන දර්ශක සැලකීමේදී ද වඩාත් පසුබෑමකට ලක්ව ඇති ජන කොට්ඨාශය ලෙස වැවිලි ප්‍රජාව සැලකිය හැක. වැවිලි ප්‍රජාව ජීවත්වන නිවාස වලින් 58% කට අධික ප්‍රමාණයක් ''ලයින් කාමර'' (පේළි නිවාස) වශයෙන් හඳුන්වනු ලබයි. (ජාතික වශයෙන් ගත් කල මෙවැනි නිවාසයන් හි ප්‍රතිශතය 3.8%කි). පේළි වශයෙන් එකිනෙකට යාබදව පවතින, වර්ග අඩි 200ක පමණ වපසරියකට සීමා වූ මෙම ලයින් කාමර සිය වාසස්ථාන කොටගත් පවුල් සංඛ්‍යාව 1,72,700 ක් පමණ වේ. වාතාශ්‍රය අවම වීම, අධික තදබදය, පෞද්ගලිකත්වයක් නොමැති වීම මෙන්ම විවිධ වූ අපචාරයන්ට ගොදුරු වීම, අනාරක්ෂිත බව හා සමාජ පිළිගැනීමක් නොමැති වීම ඇතුළු බොහෝ සමාජයීය ගැටළු මෙමගින් නිර්මාණය වී ඇත.

අනෙකුත් ප්‍රජාවන් හා සමාන වූ අභිමානයකින් යුතුව ජීවත්වීමේ අයිතිය වැවිලි ප්‍රජාව වෙත ද හිමිකර දීමේ අභිලාශයෙන්, රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් මත පදනම්ව පර්චස් 07 ක ඉඩකඩක වර්ග අඩි 550 ක වපසරියකින් යුතු පානීය ජලය හා සනීපාරක්ෂක පහසුකම් සහිත "තනි ඒකක" නිවාස ලබා දීමේ ව්‍යාපෘතිය මෙම අමාත්‍යාංශය විසින් 2015 වසරේදී ආරම්භ කොට ක්‍රියාත්මක කරමින් පවතී. පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම අනුව 2020 වසර අවසන් වන විට නිවාස ඒකක 50,000 ක් වැවිලි ප්‍රජාව වෙත හිමිකර දීම මෙම අමාත්‍යාංශයේ අපේක්ෂාව වේ. ඒ අනුව, 2016 වසරේ දී රජයේ ප්‍රතිපාදන හා ඉන්දියානු රජයේ පූර්ණ සහාය යටතේ නිවාස යෝජනා ක්‍රම 2 ක් මෙම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කෙරේ.

### 8.2.1 "හරිත රන්" නිවාස යෝජනා ක්‍රමය (ගම්මාන/නගර සංකල්පය) (Green Gold Housing - Village/Township Concept)

2016 වසරේදී රජයේ මූල්‍ය ප්‍රතිපාදන මත අරඹන ලද "හරිත රන්" නිවාස යෝජනා ක්‍රමය යටතේ වසර අවසන් වන විට නිවාස 1,430 ක් ඉදිකිරීම් සඳහා අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබා දී ඇත. නුවරඑළිය, හැටන්, කෑගල්ල, බදුල්ල, රත්නපුර, මහනුවර හා ගාල්ල යන වැවිලි මානව සංවර්ධන බල ප්‍රදේශ 7 ආවරණය වන පරිදි ඉදි කෙරෙන මෙම නිවසක වටිනාකම රු: 650,000/= ලෙසට ඇස්තමේන්තු ගත කර ඇත. මෙම වැඩ සටහන යටතේ නිවාස ඉදි කිරීම සඳහා වැය කෙරෙන මුදලෙන් 47% ක් රජයේ ප්‍රදාන වශයෙන්ද, ඉතිරි 53% ණය මුදල් වශයෙන් ද ලබා දෙන අතර එම ණය මුදල 7.5% ක වාර්ෂික පොලියක් යටතේ වසර 15 ක් තුළ ප්‍රතිලාභියාගේ සේවක වැටුපෙන් අය කෙරේ. නාය යාමෙන් නිවාස අහිමි වූවන් වෙත පූර්ණ ප්‍රදානයක් වශයෙන් මෙම නිවාස ලබා දීම සිදු කරයි. 2016 වර්ෂය අවසන් වන විට නිවාස 493 ක් නිමකර ප්‍රතිලාභීන් වෙත පවරා දී ඇති අතර නිවාස 937 ක් ඉදිකිරීම්වල විවිධ අදියරයන් හි පවතී. මේ හා සමගාමීව ප්‍රාදේශීය මට්ටමින් ජල ව්‍යාපෘති 513 ක් ක්‍රියාත්මක කරන ලද අතර, ඒ සඳහා රුපියල් මිලියන 27ක ප්‍රතිපාදන 2016 වර්ෂයේදී වෙන් කරන ලදී.





හැටන් ප්‍රාදේශීය කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද හොරණ වැවිලි සමාගමට අයත් බඹරකැලේ වතුයායේ බඹරකැලේ කොටසේ නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය
ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව 20, පිරිවැය රු: මි. 13

#### හරිත - රන් නිවාස ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය (2016 දෙසැම්බර් 31 දිනට)

| භෞතික ප්‍රගතිය | නිවාස සංඛ්‍යාව | ව්‍යාපෘති සංඛ්‍යාව (PHDT) | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | නුවර එළිය | හැටන් | මහනුවර | බදුල්ල | රත්නපුර | කෑගල්ල | ගාල්ල |
| නිම කල | 493 | 189 | 77 | 71 | 102 | - | 6 | 48 |
| නිමවෙමින් පවතින | 937 | 254 | 254 | 80 | 47 | 113 | 138 | 51 |
| එකතුව | 1430 | 443 | 331 | 151 | 149 | 113 | 144 | 99 |

#### හරිත - රන් නිවාස ව්‍යාපෘතියේ ජල ව්‍යාපෘති - ප්‍රාදේශීය මට්ටමින්

| අනුමත කරන ලද ජල ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රගතිය ප්‍රාදේශීය මට්ටමින් | | | | | | | වෙන් කල මුළු ප්‍රතිපාදන | සමස්ත පිරිවැය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | නුවරඑළිය | හැටන් | මහනුවර | බදුල්ල | රත්නපුර | කෑගල්ල | ගාල්ල | | |
| 513 | 179 | 25 | 26 | 91 | 113 | 6 | 73 | 27.06 | 23.64 |



හැටන් ප්‍රාදේශීය කාර්යාල මගින් ක්‍රියාත්මක කරන ලද කොටගල වැවිලි සමාගමට අයත් ක්‍රිස්ටෙලාස් ෆාම් වතුයායේ ක්‍රිස්ටලස් කොටසේ නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය
ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව - 20, පිරිවැය රු: මි. 20



කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

# හරිත රන් නිවාස යෝජනා ක්‍රමය යටතේ නිවාස ඉදි කිරීම හා ප්‍රගතිය

| අනු අංකය | වැවිලි ප්‍රදේශ | වතු සමාගම | වත්තේ නම | කොටස | නිවාස සංඛ්‍යාව | ඉදිකිරීම නිමකළ නිවාස සංඛ්‍යාව (2016.12.31) |
|---|---|---|---|---|---|---|
| 01 | ගාල්ල | නමුනුකුල | හුලන්දාව | බුලුවාන | 25 | |
| | | වටවල | හෝමදොල | නො . 6 | 25 | 25 |
| | | කොටගල | තවාන | තවාන | 13 | 13 |
| | | නමුනුකුල | පල්ලෙගොඩ | ඉහළ | 10 | 10 |
| | | | ගෝවින්න | ගෝවින්න | 26 | |
| එකතුව | | | | | 99 | 48 |
| 02 | රත්න-පුරය | බලන්ගොඩ | බලන්ගොඩ | මාරතැන්න | 31 | |
| | | බලන්ගොඩ | බලන්ගොඩ | දෙතනගල | 19 | |
| | | කහවත්ත | හවුපෙ | යාඉන්න | 15 | |
| | | බලන්ගොඩ | පෙට්ටිගල ( Factory) | ඉහළ | 48 | |
| එකතුව | | | | | 113 | 0 |
| 03 | බදුල්ල | පි.වි.ටි | නිඩ්වුඩ් | නීඩ්වුඩ් | 11 | 11 |
| | | නමුනුකුල | ගෝනකැලේ | පහළ | 48 | 48 |
| | | නමුනුකුල | කැනවැරැල්ල | C.V.E | 23 | 23 |
| | | ආගරපතන | පිටරත්මලේ | ඉහළ | 20 | 20 |
| | | | | | 47 | |
| එකතුව | | | | | 149 | 102 |
| 04 | කෑගල්ල | කැලනිවැලි | දේවාලකන්ද | දෙහිඕවිට | 06 | 6 |
| | | | පනාවත්ත | PAN - 04 | 26 | |
| | | | කලුපහන | නිර්මල | 9 | |
| | | | කලුපහන | වහරක | 7 | |
| | | | කලුපහන | කලුපහන | 84 | |
| | | කෑගල්ල | අටාල | නිව් වරන්දර | 12 | |
| එකතුව | | | | | 144 | 06 |
| 05 | මහනුවර | රා.වැ.ස. | ගෝමර | ලෙබනන් | 19 | 19 |
| | | ජා.වතු.ස.ම | හෝප් | පහළ | 25 | 25 |
| | | ජා.වතු.ස.ම | හෝප් | ඉහළ | 06 | 06 |
| | | රා.වැ.ස | නිකොලොය | වේරගම | 14 | 14 |
| | | රා.වැ.ස | මිඩ්ලන්ඩ් | බඹරකැලේ | 07 | 07 |
| | | පුස්සැල්ලාව | ගිරාගම | ගෝනාධික | 15 | |
| | | කහවත්ත | ගලමුදුන | Windsor Forest | 11 | |
| | | කහවත්ත | කැලෑ බොක්ක | හුලන්කන්ද | 23 | |
| | | | බෝහිල් | බෝහිල් | 16 | |
| | | | ක්‍රේහෙඩ් | ක්‍රේහෙඩ් | 15 | |
| එකතුව | | | | | 151 | 71 |
| 06 | හැටන් | බොගවන්තලාව | කොටියාගල | පහළ | 184 | |
| | | මස්කෙලිය | බ්‍රවුන්ස් | 1st | 25 | |
| | | වටවල | කැනිල්වර්ත් | 1st | 03 | 03 |
| | | හොරණ | ටිල්කල්ට්‍රි | ටිල්කල්ට්‍රි | 10 | 10 |
| | | | බඹරකැලේ | බඹරකැලේ | 20 | 20 |
| | | | මහනිලු | මහගල | 15 | |
| | | කැලනිවැලි | ඉන්ජෙස්ට්‍රි | Portre | 15 | 08 |
| | | කොටගල | මේෆීල්ඩ් | මේෆීල්ඩ් | 16 | 16 |
| | | | ක්‍රිස්ටෙලාස් ෆාම් | ක්‍රිස්ටලස් | 20 | 20 |
| | | | ස්ටෝනික්ලිෆ් - | රොසිටා | 23 | |
| එකතුව | | | | | 331 | 77 |
| 07 | නුවරඑළිය | ආගරපතන | හුට්විල් | Fankerton | 150 | |
| | | උඩපුස්සැල්ලාව | කෝට්ලොජ් | කෝට්ලොජ් | 24 | 24 |
| | | තලවකැලේ | ඩෙස්ෆෝර්ඩ් | ඉහළ | 16 | 16 |
| | | | | Lorne | 15 | 15 |
| | | | | පහළ | 14 | 14 |
| | | ආගරපතන | ටොරින්ටන් | Stair | 12 | 12 |
| | | උඩපුස්සැල්ලාව | කොන්කෝඩියා | ඉහළ | 02 | 02 |
| | | ඇල්පිටිය | ඩන්සිනන් | අකරමලේ | 23 | |
| | | | ෂීන් | පහළ / පුන්ඩලුඔය | 18 | 18 |
| | | ඇල්පිටිය | | ඉහල / පුන්ඩලුඔය | 12 | 12 |
| | | මතුරට | කබරගල | පහළ | 10 | 10 |
| | | ඇල්පිටිය | මැඩකොම්බ්‍රා | ඉහළ / පහළ | 23 | |
| | | වටවල | වෝල්ට්‍රිම් | වෝල්ට්‍රිම් | 10 | 10 |
| | | කෑගල්ල | ලකීලෑන්ඩ් | ලකීලෑන්ඩ් | 25 | 25 |
| | | මතුරට | මහඋෟව | 2nd | 15 | 15 |
| | | කැලණිවැලි | ග්ලැසෝ | ඇඩ්නිවන් | 15 | 15 |
| | | තලවකැලේ | සමර්සෙට් | ලැන්ග්ඩේල් | 01 | 01 |
| | | අගලවත්ත | වෙදමුල්ල | වැවැන්ඩන් | 58 | |
| එකතුව | | | | | 443 | 189 |
| මුළු එකතුව | | | | | 1430 | 493 |



## 8.2.2 "ඉන්දියානු රජයේ සහාය යටතේ ඉදිවන" නිවාස ව්‍යාපෘතිය

ඉන්දියානු රජයේ සහාය යටතේ ආරම්භ කර ඇති මෙම ව්‍යාපෘතිය මගින් වැවිලි ප්‍රජාව වෙත නිවාස ඒකක 4,000 ක් ඉදිකිරීමට නියමිත ව ඇත. එක් නිවසක වටිනාකම රුපියල් මිලියනයක් ලෙසට ඇස්තමේන්තු ගතකර ඇති මෙම ව්‍යාපෘතිය සඳහා, නිවසක් වෙනුවෙන් ඉන්දියානු රජය විසින් රුː 950,000/= ක්ද, අදාල වැවිලි සමාගම විසින් රුː 30,000/= ක් හා ප්‍රතිලාභියා විසින් රුː 20,000/= ක දායකත්වයක් ද සපයනු ලබයි. මෙම නිවාස යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය පානීය ජල පහසුකම්, විදුලිය, ප්‍රවේශ මාර්ග ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් ශ්‍රී ලංකා රජය මගින් සපයනු ලබයි. ඒ වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ 2016 වසර සඳහා රු.මි. 75 ක් වෙන් කර ඇත.

### 1 වන අදියර

මෙම ව්‍යාපෘතියේ ප්‍රථම අදියර වශයෙන් නිවාස ඒකක 1,134 ක් ඉදිකිරීම සඳහා වන ගිවිසුමට 2016.04.01 දින ඉන්දියානු මහ කොමසාරිස්තුමා හා ගරු අමාත්‍යතුමා විසින් අත්සන් තබන ලදී. ඒ අනුව, මේ වන විට නිවාස 1,134 ක් ඉදිකිරීම සඳහා මූලික කටයුතු ආරම්භ කර ඇත.

### 11 වන අදියර

මේ යටතේ, නාය යාමෙන් පීඩාවට පත් වූවන් හා නායයාමේ අවදානමට ලක් විය හැකි අධි අවදානම් ප්‍රදේශවල ජීවත් වන ජනතාව වෙනුවෙන් ප්‍රමුඛතාව දෙමින් නිවාස ඒකක 2,866 ක් ඉදිකිරීමට නියමිතව ඇත. අදාල වතු සමාගම්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතන හා එක්ව එවැනි ප්‍රදේශ හඳුනාගැනීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

**ඉන්දියානු මහ කොමසාරිස්තුමා හා ගරු අමාත්‍ය පලනි තිගාම්බරම් මැතිතුමා විසින් නිවාස ඒකක 1,134 ක් ඉදිකිරීම සඳහා වන ගිවිසුමට අත්සන් තැබීම 2016.04.01**





## ඉන්දියානු රජයේ සහාය යටතේ ඉදිවන නිවාස ව්‍යාපෘතියේ පළමු අදියරේ ප්‍රගතිය

| වැවිලි ප්‍රදේශය | වත්තේ නම | කොටස | නිවාස සංඛ්‍යාව | ප්‍රගතිය |
|---|---|---|---|---|
| නුවර එළිය | ඩන්සිනන් | මැද කෙටස | 404 | භූමිය සකස් කිරීම, ප්‍රතිලාභීන් තෝරා ගැනීම හා ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරෙමින් පවතී. |
| | ඩයගම | පළමු සහ දෙවන කෙටස | 150 | ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. |
| බදුල්ල | ලෙජර් වත්ත | ලෙජර්වත්ත | 75 | භූමිය සකස් කිරීම සිදුකෙරෙමින් පවති. |
| | | නාරංගල | 50 | භූමිය සකස් කිරීම සිදුකෙරෙමින් පවති. |
| නුවර | හෙල්බොඩ | මැද කොටස | 100 | නිවාස ව්‍යාපෘතියේ මූලික අදියර ක්‍රියාත්මක වෙමින් පවතී. |
| හැටන් | බොගවාන | බොගවාන | 100 | මැනුම් කටයුතු සිදු කෙරෙමින් පවතී. |
| | | බ්‍රිඩ්වෙල් (Bridwell) | 155 | අත්තිවාරම් සහ කැනීම් සිදු කෙරෙමින් පවතී. |
| | | ලින්ස්ටඩ් (Lynsted) | 100 | මැනුම් කටයුතු සිදු කෙරෙමින් පවතී. |



මහනුවර ප්‍රාදේශීය කාර්යාලය මගින් ඉන්දියානු ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස ව්‍යාපෘතිය - හෙල්බොඩ මැද කොටස



හැටන් ප්‍රාදේශීය කාර්යාලය මගින් ඉන්දියානු ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස ව්‍යාපෘතිය - බොගවාන බ්‍රිඩ්වෙල්




කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය







කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය



## 8.2.3. නායයාමෙන් පීඩාවට පත්වූවන් සඳහා නිවාස ඉදි කිරීම (2015 අවිච්ඡේද ව්‍යාපෘති)

ඌව, සබරගමුව හා මධ්‍යම පළාත්වල නාය යාමෙන් පීඩාවට පත්වූ හෝ නායයාමේ දැඩි අවදානමට ලක් වූ වතු සේවක පවුල් 308 ක් සඳහා දින 100 රජයේ වැඩ පිළිවෙල යටතේ නිවාස ඉදිකිරීම ආරම්භ කරන ලදී. වර්ග අඩි 550 ක ප්‍රමාණයකින් යුත් මෙම නිවසක වටිනාකම රුː මි. 1.2 ක් වන අතර පර්චස් 07 ක ඉඩමක් හා නිදන කාමර 02 ක්, මුළුතැන් ගෙයක්, ආලින්දයක් හා යාකළ වැසිකිලියක් ඊට අයත් වේ.

2015 අවසන් වන විට රුː මි. 302 ක පිරිවැයක් දරා ඉන් නිවාස 288 ක වැඩ අවසන් කරන ලදී. 2016 වසරේ ජුනි මස අවසන් වන විට ඉතිරි නිවාස 20 හි වැඩ සම්පූර්ණයෙන් නිම කර ප්‍රතිලාභීන් වෙත ලබා දීමට කටයුතු කර ඇත.



නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද ආගරපතන වැවිලි සමාගමට අයත් ඇල්බියන් වතුයායේ, **Aldlaw** කොටසේ නිවාස ඉදිකිරිමේ ව්‍යාපෘතිය
පිරිවැයː රුː මි. 6.5, ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව 10

## 8.2.4 නව ජීවන නිවාස වැඩ සටහන යටතේ නිවාස ඉදිකිරීම (2015 අවිච්ඡේද)

2014 වසරේ ක්‍රියාත්මක කළ නව ජීවන නිවාස ව්‍යාපෘතිය යටතේ, තෝරාගත් වතු පවුල් සඳහා නව නිවාස ලබාදීමට කටයුතු කර ඇති අතර, එහි එක් නිවසක වටිනාකම රුː 650,000/= වේ. මෙම වටිනාකමින් 47% ක් රජයේ ප්‍රදාන වශයෙන් ද, 53% ක් සේවක වැටුපෙන් අය කරනු ලබන ණය මුදල් වශයෙන් දරනු ලබයි.

ඒ අනුව, 2015 වසරේ වැඩ අවසන් ව නොතිබූ නිවාස 336 ක් ඉදිකිරීමේ කටයුතු 2016 වර්ෂය තුල සම්පූර්ණ කර ඇති අතර ඉතිරි නිවාස 50 ක්‍රියාත්මක අදියරේ පවතී. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් අමාත්‍යාංශය ලබා දී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රුː මි. 121 ක් වන අතර එහි මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 119 කි.



කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

එමෙන්ම, නව ජීවන නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස හිමි වූ වතු සේවක පවුල් 328 ක් ඉලක්ක කොට ගෙන පානීය ජල පහසුකම් සැපයීමේ ව්‍යාපෘති 16 ක් ද 2016 වර්ෂයේදී ආරම්භ කළ අතර ඒ සඳහා නිවාස වැඩසටහන යටතේ අමාත්‍යාංශය විසින් රු: මි.10 ක ප්‍රතිපාදන වෙන් කරන ලදී.



රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද අගලවත්ත වැවිලි සමාගමට අයත් මාරතැන්න වතුයායේ කොළඹගම කොටසේ නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය
පිරිවැය: රු.මි. 36 - ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව 30

## නව ජීවන නිවාස වැඩසටහන භෞතික ප්‍රගතිය (2015 අවිච්ඡේද)

| භෞතික ප්‍රගතිය | නිවාස ගණන (2015 අවිච්ඡේද) | ප්‍රගතිය - ප්‍රාදේශීය මට්ටම | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | නුවරඑළිය | හැටන් | මහනුවර | බදුල්ල | රත්නපුරය | කෑගල්ල |
| නිමකල | 336 | 125 | 44 | 40 | 20 | 50 | 57 |
| අවිච්ඡේද | 50 | - | 10 | 40 | - | - | - |
| **එකතුව** | **386** | **125** | **54** | **80** | **20** | **50** | **57** |



## නව ජීවන නිවාස ව්‍යාපෘතියට අදාලව ක්‍රියාත්මක කරන ලද ජල සම්පාදන ව්‍යාපෘතීන් හි ප්‍රගතිය

| | අනුමත කරන ලද ජල ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රාදේශීය වැවිලි සමාගම | වත්තේ නම | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ගාල්ල | 03 | නමුණුකුල | වල්පිට | 25 |
| | | හොරණ | ෆොසෙස්ටර් | 16 |
| | | නමුණුකුල | සිට්රස් | 20 |
| බදුල්ල | 01 | හපුගස්තැන්න | ආදාවත්ත | 20 |
| රත්නපුරය | 02 | බලංගොඩ | මැද්දකන්ද | 10 |
| | | කහවත්ත | ඕපාත | 15 |
| මහනුවර | 03 | පුස්සැල්ලාව | ස්ටිලන්බර්ග් | 40 |
| | | උඩපුස්සැල්ලාව | ඩක්වරි | 10 |
| | | SLSPC | ගෝමෙර | 30 |
| කෑගල්ල | 03 | කැළනිවැලි | කැළනි | 20 |
| | | මල්වත්තවැලි | මොරඑළිය | 18 |
| | | කෑගල්ල | උඩපොල | 19 |
| නුවරඑළිය | 04 | අගරපතාන | නිව්පෝට්මෝර් | 30 |
| | | කෑගල්ල | ගම්පහ | 15 |
| | | කෑගල්ල | ලකී ලෑන්ඩ් | 20 |
| | | කැළනිවැලි | නුවරඑළිය | 20 |
| මුළු ගණන | 16 | | | 328 |

## 8.3 පසුගාමී ප්‍රදේශයන්හි සමාජ ආර්ථික සංවර්ධනය

ඉතා අවම පහසුකම් යටතේ ජීවත් වන වතු ජනතාව සඳහා පානීය ජල ව්‍යාපෘති ඇති කිරීම, වැසිකිළි පහසුකම් ලබාදීම, ප්‍රවේශ මාර්ග අලුත්වැඩියාව / ඉදිකිරීම, ලයින් කාමර වහල නැවත සෙවිලි කිරීම, ළමා සංවර්ධන මධ්‍යස්ථාන ඉදිකිරීම යනාදී විවිධ වූ සංවර්ධන ව්‍යාපෘති මේ යටතේ ක්‍රියාත්මක කරනු ලබයි.

ඊට අමතර වශයෙන් හදිසි ආපදා තත්ත්වයකට පත්වූ වැවිලි ප්‍රජාව වෙනුවෙන් තාවකාලික වාසස්ථාන සකස් කිරීම හා ඊට අවශ්‍ය පහසුකම් සැලසීමද අතුරු පියවරයන් වශයෙන් මේ යටතේ ක්‍රියාත්මක වේ.

පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා අමාත්‍යාංශය විසින් 2016 වසරේ රුපියල් මිලියන 200 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. ඒ යටතේ, 2015 වසර අවසන් කාර්තුවේ අනුමත කරන ලද එහෙත් එම වර්ෂයේදී අවසන් කිරීමට නොහැකි වූ අවිච්ඡේද ව්‍යාපෘති නිම කිරීම සඳහා 2016 වර්ෂයේදී රුපියල් මිලියන 78 ක පිරිවැයක් දරන ලදී.



කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

## 2015 වසරේ අවිච්ඡේද ව්‍යාපෘති හා වෙන් කල ප්‍රතිපාදන

| ව්‍යාපෘතියේ ස්වභාවය | ව්‍යාපෘති ඒකක සංඛ්‍යාව | අනුමත මුදල (රුː මි) | 2016/12/31 දිනට වියදම (රුː මි) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| පේළි නිවාසවල වහළ නැවත සෙවිලි කිරීම | 700 | 12.00 | 11.99 | 100 |
| ජල ව්‍යාපෘති | 19 | 6.65 | 6.65 | |
| ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංවර්ධනය | 21 | 5.10 | 5.11 | |
| මාර්ග සංවර්ධන ව්‍යාපෘති, අධ්‍යාපන පහසුකම් වැඩි දියුණු කිරීම, ආගමික සිද්ධස්ථාන හා සංස්කෘතික මධ්‍යස්ථාන සංවර්ධනය, ක්‍රීඩා පිටි හා ක්‍රීඩා පහසුකම් වැඩි දියුණු කිරීම හා වෙනත් විශේෂ ව්‍යාපෘති | 92 | 54.55 | 54.68 | |
| එකතුව | | 78.30 | 78.43 | 100 |



හැටන් ප්‍රාදේශීය කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද කොටගල වැවිලි සමාගමට අයත් යුලිෆීල්ඩ් වතුයායේ වෙලින්ටන් කොටසේ කොන්ක්‍රීට් මාර්ගය ඉදිකිරීම.
පිරිවැයː රු.මි. 0.9



## 8.3.1 2016 වසරේ දී ආරම්භ කරන ලද විවිධ වැඩසටහන් හා ප්‍රගතිය.

### 8.3.1.1 වහල දිරාපත්වීම හේතුවෙන් වාසස්ථානයකට නුසුදුසු තත්ත්වයේ ඇති පෙළි නිවාස 905 ක වහල නැවත සෙවිලි කිරීම.

වැවිලි මානව සංවර්ධන භාරයට අයත් ප්‍රදේශ 07 තුළ පිහිටි, ඉතා අබලන් තත්ත්වයේ පේළි නිවාස 905 ක වහල නැවත සෙවිලි කිරීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර ඇත. නව නිවාස ඉදිකිරීම දීර්ඝ කාලීන ව්‍යාපෘතියක් වන බැවින්, අතුරු පියවරක් වශයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන අතර 2016 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ඒ සඳහා රුː මි. 60 ක පිරිවැයක් දරා ඇත.

මීට අමතරව හදිසි ආපදා තත්ත්වයන්ට මුහුණ දුන් වතු ජනතාව වෙනුවෙන් තාවකාලික වාසස්ථාන ඉදිකිරීම් සඳහා රුː මි. 18 ක් පමණ වටිනාකමකින් යුත් සෙවිලි තහඩු 11,292ක් නුවරඑළිය, හැටන්, කෑගල්ල, බදුල්ල, රත්නපුර හා මහනුවර යන වැවිලි ප්‍රදේශ වෙත බෙදා හැර ඇත.




මහනුවර ප්‍රාදේශීය කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද ජේ.ඊ.ඩී.බී. සමාගමට අයත් රොක්වුඩ් වතුයායේ, පේළි නිවාස අංක 4හි වහළ නැවත සෙවිලි කිරීමේ ව්‍යාපෘතිය

### 8.3.1.2 සෞඛ්‍යාරක්ෂිත පානීය ජල පහසුකම් සැපයීම.

ජල උල්පත් බොහොමයක් වතු ජනාවාස ස්ථාන ගතවී ඇති කඳුකර ප්‍රදේශයෙන් ආරම්භ වුවද සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය ලබා ගැනීමේ හැකියාව වතු ජනතාව වෙත හිමි වී ඇත්තේ ඉතා අල්ප වශයෙනි. ජල සැපයුම් අනාරක්ෂිතව තිබීම හේතුවෙන් ජලය මගින් පැතිරී යන පාචනය වැනි රෝග රැසකට ගොදුරු වීමේ වැඩි අවදානමක් වැවිලි ප්‍රජාව තුළ පවතින බැවින්, එසේ හඳුනාගත් ප්‍රදේශ ඉලක්ක කර ගනිමින් සෞඛ්‍යාරක්ෂිත පානීය ජල සම්පාදන ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කර ඇත. 2015 දී ආරම්භ කර, සම්පූර්ණ කිරීමට නොහැකි වූ ජල ව්‍යාපෘති 19 හි වැඩ 2016 දෙසැම්බර් මස අවසන් වන විට නිමාකර ඇත. එමෙන්ම, මෙම වසරේදී නව ජල ව්‍යාපෘති 27 ක් ආරම්භ කොට ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අමාත්‍යාංශය විසින් පියවර ගෙන ඇති අතර එහි සමස්ත පිරිවැය රුː මි. 7 කි. ඉන් ව්‍යාපෘති 23 ක වැඩ සම්පූර්ණයෙන් නිම කර ඇත.




කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

## පසුගාමී ප්‍රදේශ සඳහා ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (2016 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය)

| ප්‍රගතිය | ජල ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රගතිය - ප්‍රාදේශීය මට්ටමින් | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | නුවරඑළිය | හැටන් | මහනුවර | බදුල්ල | රත්නපුරය | කෑගල්ල | ගාල්ල |
| 100% ඉදිකිරීම අවසන් | 23 | 01 | 01 | 05 | 12 | 01 | 02 | 01 |
| ක්‍රියාත්මක වෙමින් පවතින | 04 | - | - | - | 01 | 02 | 01 | - |
| එකතුව | 27 | 01 | 01 | 05 | 13 | 03 | 03 | 01 |



ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද නමුණුකුල වැවිලි සමාගමට අයත් පල්ලේගොඩ වතුයායේ ජල ව්‍යාපෘතිය.
ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව - 10,
මුළු පිරිවැය රු:මි - 0.6

### 8.3.1.3 සනීපාරක්ෂක පහසුකම් සැපයීම

දත්ත සමීක්ෂණ වාර්තා අනුව වැවිලි ප්‍රජාවගෙන් 25% කට අධික ප්‍රමාණයක් සඳහා වැඩි දියුණු කළ සනීපාරක්ෂක පහසුකම් ලැබී නොමැති බව පෙනී යයි. ලයින් කාමර වල ජීවත් වන එම ජනතාව වෙනුවෙන් ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සැපයීමේ අරමුණින්, 2016 වසරේදී මෙම අමාත්‍යාංශය විසින් වැසිකිළි 542 ක් අලුතින් ඉදිකිරීම ආරම්භ කරන ලද අතර ඉන් 532ක වැඩ නිමකර ප්‍රතිලාභීන් වෙත පවරා දී ඇත. එම ඉදිකිරීම් වතු සේවක නිවාස සමූපකාර සමිති හරහා සිදු කල අතර වැසිකිළි වලවල් කැපීම වැනි කටයුතු සඳහා ප්‍රතිලාභීන්ගේ දායකත්වය ලැබී ඇත. එක් ඒකකයක් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු: 50,000.00 කි. ඒ අනුව, 2016 වසර අවසන් වන විට මේ සඳහා වැය කර ඇති මුදල රු: මි. 7 කි. එයට අමතරව 2015 වසරේදී වැඩ අවසන් නොවූ වැසිකිළි 64 ක ඉදිකිරීම්ද 2016 වර්ෂයේ පළමු කාර්තුව තුළදී අවසන්





## 2016 වසර වැසිකිළි ඉදිකිරීම ප්‍රාදේශීය මට්ටමින්

| ප්‍රගතිය | වැසිකිළි සංඛ්‍යාව | ප්‍රගතිය - ප්‍රාදේශීය මට්ටමින් | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | නුවරඑළිය | මහනුවර | බදුල්ල | රත්නපුරය | කෑගල්ල | ගාල්ල |
| 100% ඉදිකිරීම් අවසන් | 532 | 10 | 157 | 145 | 120 | 55 | 45 |
| ක්‍රියාත්මක වෙමින් පවතින | 10 | - | - | - | - | - | 10 |
| එකතුව | 542 | 10 | 157 | 145 | 120 | 55 | 55 |




කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද ඇල්පිටිය වැවිලි සමාගමට අයත් ඇඳුරාපොල වතුයායේ ඇඳුරාපොල කොටසේ වැසිකිළි ව්‍යාපෘතිය
ඒකක සංඛ්‍යාව 10, පිරිවැය රු:මි. 0.5

### 8.3.1.4 ළමා සංවර්ධන මධ්‍යස්ථාන නවීකරණය කිරීම

වැවිලි ක්ෂේත්‍රයේ රැකියාවන් හි නිරත ප්‍රජාවගේ කුටුම්භයන්හි වයස අවුරුදු 2 ට අඩු දරුවන් රැක බලා ගැනීම හා අවුරුදු 3 - 5 අතර දරුවන් පාසල් අධ්‍යාපනයට හුරු කිරීම යන කාර්යයන් ළමා සංවර්ධන මධ්‍යස්ථාන හරහා සිදු කරන නමුත් ඉඩ පහසුකම් නොමැතිවීම, උපකරණ හිඟවීම, නිසි නඩත්තුවක් නොවීම යනාදී කරුණු හේතුවෙන් ප්‍රමිති වර්ගීකරණය අනුව මේවා ශ්‍රේණිගත කිරීමේදී ඉතා පහළ අගයක පවතී. එබැවින්, එසේ හඳුනාගත් ළමා සංවර්ධන මධ්‍යස්ථාන හා පෙර පාසල් සංවර්ධනයට සහ එකී මධ්‍යස්ථානයන් වෙත උපකරණ ලබාදීම සඳහා 2016 වසරේ දෙසැම්බර් වන විට අමාත්‍යාංශය දරා ඇති සමස්ත පිරිවැය රු: මි. 5 කි.




මහනුවර ප්‍රාදේශීය කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද පුස්සැල්ලාව වැවිලි සමාගමට අයත් රොච්චයිල්ඩ් වතුයායේ ග්ලේන්ලෙඩ් කොටසේ ළමා සංවර්ධන මධ්‍යස්ථානය සංවර්ධන ව්‍යාපෘතිය පිරිවැය රු:මි. 1.6

## 8.3.1.5 ප්‍රවේශ මාර්ග / පොදු පහසුකම් සංවර්ධනය

වැවිලි ප්‍රජාව ඉලක්ක කර ගනිමින්, විශේෂයෙන් නිසි පිවිසුම් මාර්ග නැති ස්ථාන වෙත ප්‍රවේශ මාර්ග ලබා දීම, පඩිපෙළවල් හා කානු පද්ධති සංවර්ධනය කිරීම, ආරක්ෂිත බැමි සැකසීම, හා ඔවුන්ගේ පොදු ජන ජීවිතය යථාවත් වනු පිණිස අවැසි වෙනත් පහසුකම් විශේෂයෙන් ආගමික හා සංස්කෘතික මධ්‍යස්ථාන නගා සිටුවීම, ක්‍රීඩා පහසුකම් සැපයීම, සුභ සාධන සංගම් වෙත කූඩාරම් හා උපකරණ ලබා දීම යනාදී ව්‍යාපෘති ගණනාවක් මේ යටතේ සිදු කරනු ලබයි.

### පසුගාමී ප්‍රදේශ සංවර්ධනය සඳහා 2016 වසරේ ක්‍රියාත්මක කරන ලද නව ව්‍යාපෘතින්

| ව්‍යාපෘතියේ ස්වභාවය | ක්‍රියාත්මක කරනු ලබන ආයතන | | මුළු ව්‍යාපෘති ඒකක සංඛ්‍යාව | 2016.12.31 දිනට වැඩ නිමකල | අනුමත මුදල රු:මි. | 2016.12.31 දිනට වියදම රු:මි |
|---|---|---|---|---|---|---|
| | වැ.මා. ස.හා. | ප්‍රා.ලේ. කා/ප්‍රා සභා | | | | |
| ජල සම්පාදනය | ✓ | ✓ | 27 | 23 | 6.70 | 6.72 |
| වැසිකිළි ඉදිකිරීම | ✓ | | 542 | 532 | 25.13 | |
| වහල නැවත සෙවිලි කිරීම | ✓ | | 905 | 905 | 60.0 | 60.14 |
| මාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රීඩා පිටි, ආගමික / සංස්කෘතික මධ්‍යස්ථාන සංවර්ධනය හා වෙනත් විශේෂ ව්‍යාපෘති (පාසැල්/පෙර පාසැල්/ ළමා සංවර්ධන මධ්‍යස්ථාන ඇතුළු) | ✓ | ✓ | 108 | 83 | | 54.8 |
| එකතුව | | | | | **146.83** | **145.42** |



### අමාත්‍යාංශය විසින් 2016 වසරේ ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති












කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය






# 8.4. ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්

වැවිලි ප්‍රජාවගේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා වන පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි මූලික වශයෙන් අවධානය යොමු කර ඇති හා වැඩි දියුණු කල යුතු ක්ෂේත්‍ර ලෙසට හඳුනාගෙන ඇති, සෞඛ්‍යය හා පෝෂණය, නිපුණතා සංවර්ධනය හා වෘත්තීය පුහුණුව, ප්‍රජා සවිබල ගැන්වීම (කාන්තාවන් හා තරුණ තරුණියන්) යන අංශයන් නගාසිටුවීම සඳහා අවශ්‍ය දැනුවත් කිරීම්, තාක්ෂණික ඥානය හා පුහුණුව ලබාදීම්, උපකරණ හා පහසුකම් ලබාදීම ඇතුළු සමාජ සවිබල ගැන්වීම් වැඩසටහන් රාශියක් මේ යටතේ ක්‍රියාත්මක කරනු ලබයි.

ජාතික ක්‍රියාකාරී සැලැස්මට අනුගතව, එක් එක් ක්ෂේත්‍ර යටතේ, වැවිලි ප්‍රජාව සඳහා විශේෂිත  වූ වැඩ සටහන් මෙම අමාත්‍යාංශය හා සම්බන්ධීකරණය වෙමින් අනෙකුත් අමාත්‍යාංශ මගින් සිදු කෙරේ.

## 8.4.1 ප්‍රජාව දැනුවත් කිරීම

අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ අවධානයට පාත්‍ර වූද, ජාතික අවශ්‍යතාවක් සේ සලකා ක්‍රියා කරන්නා වූ ද, සෞඛ්‍යය හා පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම, වකුගඩු රෝග මැඩලීම, මත්ද්‍රව්‍ය නිවාරණය, පරිසර සංරක්ෂණය වැනි වැඩසටහන් ක්‍රියාත්මක කොට වැවිලි ප්‍රජාව දැනුවත් කිරීම සඳහා 2016 දෙසැම්බර් මස වන විට රුඃ මි. 2ක ප්‍රතිපාදන මෙම අමාත්‍යාංශය මගින් යොදවා ඇත. මෙම වැඩසටහන් වතු ප්‍රදේශ ආවරණය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හරහා සිදු කරනු ලබන අතර, ඒ සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු අමාත්‍යාංශය විසින් එකී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වෙත අනුයුක්ත කර ඇති වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නන්ගේ (PCCF) මූලිකත්වයෙන් සිදු කරනු ලැබේ.



ප්‍රජා දැනුවත් කිරීමේ
වැඩ සටහනක්



## 8.4.2 ගෙවතු වගාව හා ආහාර සුරක්ෂිතතාව

වැවිලි ප්‍රජාවගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම, රසායනික ද්‍රව්‍ය භාවිතය අවම කිරීම, පරිසර සංරක්ෂණය හා ගෙවතු අලංකරණය සඳහා ප්‍රජා සහභාගිත්වය හා අවධානය යොමු කරවීමේ අරමුණින් වතු ජනතාව වෙත ලබා දුන් නව නිවාස ව්‍යාපෘති ආශ්‍රිතව



කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

ගෙවතු වගා කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය දැනුම, උපකරණ, පැළ හා බීජ ලබා දීම මෙමගින් සිදු කරනු ලබයි. අදාල ප්‍රාදේශීය වැවිලි සමාගම් හරහා ප්‍රජා අවශ්‍යතාව මත ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහන වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට මිලියන 4 ක පිරිවැයක් දරා ඇත.

## ගෙවතු වගාව හා ආහාර සුරක්ෂිතතාව වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබා දීම - ප්‍රාදේශීය මට්ටමින්

| මුළු ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව | ප්‍රාදේශීය වැවිලි මානව සංවර්ධන භාර ප්‍රදේශය | | | | | |
|---|---|---|---|---|---|---|
| | හැටන් | මහනුවර | බදුල්ල | රත්නපුර | කෑගල්ල | ගාල්ල |
| 1176 | 136 | 132 | 207 | 125 | 76 | 500 |



## 8.4.3 ස්වයං රැකියා උත්පාදනය

වැවිලි ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීමේ අරමුණින්, මෙතෙක් අක්‍රීයව පැවැති චක්‍රීය අරමුදල නැවත යථාවත් කොට ස්වයං රැකියා ඇරඹීමට අපේක්ෂා කරන්නන්ට අවශ්‍ය ණය මුදල් ලබා දීමට මෙම අමාත්‍යාංශය විසින්, ලංකා බැංකුව සමග ගිවිසුමකට එළඹෙන ලදී.

මෙහි ආරම්භක පියවර ලෙස 2016.08.04 දින නුවරඑළිය හා හැටන් ප්‍රදේශ වලින් තෝරාගන්නා ලද ප්‍රතිලාභීන් 16 දෙනෙකුට, කුකුල් පාලනය, ඇඳුම් මැසීම, පරිගණක අලුත්වැඩියාව හා වගා කටයුතු යනාදිය සඳහා, එක් අයෙකුට රු. 100,000.00 බැගින් ණය මුදල් ලබා දීමට පියවර ගන්නා ලදී.

ස්වයං රැකියා පුළුල් කරගැනීම සඳහා අවශ්‍ය ණය මුදල් ලබා ගැනීමේ පහසුකම් සැලසීම ද ලංකා බැංකුව මගින් සිදු කරන අතර, ඒ සඳහා අවශ්‍ය පුහුණුවීම් අදාල ආයතන මගින් ලබා දෙනු ලැබේ. වැඩසටහන පුළුල් කිරීමේ අදිටනින් ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ දෙවන අදියරේ කටයුතු තවදුරටත් සිදුවෙමින් පවතී.



## 8.4.4 නිපුණතා සංවර්ධනය හා වෘත්තීය පුහුණුව

පාසැල් අධ්‍යාපනය හැර යන්නන් හා නුපුහුණු ශ්‍රමිකයන් නිසි ජීවනෝපාය ක්‍රමවේදයකට අනුගත කරවීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශකත්වය හා පුහුණුව ලබාදීම සඳහා මෙම අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත් කර ඇති තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය හා ප්‍රජා ශක්ති ව්‍යාපෘතිය හරහා මෙම වැඩපිළිවෙල ක්‍රියාවට නංවනු ලබයි.

ඒ අනුව, තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය මගින් පවත්වාගෙන යනු ලබන පාඨමාලාවන් හි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට අවශ්‍ය මානව හා තාක්ෂණික පුහුණු පහසුකම් ලබා දීම සඳහා 2016 වසරේදී රුː මි. 109 ක මුදලක් අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ වෙන් කරන ලදී.

එසේ නමුත්, සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම මුහුණ දී තිබූ මූල්‍ය අර්බුදය හේතුවෙන් එම මුදල, එහි සේවක වැටුප් හා පරිපාලන වියදම් වෙනුවෙන් වැය කර ඇත.

ඒ අනුව, මූල්‍ය අර්බුදය හා අමාත්‍යාංශ වෙනස්කම් හේතුවෙන් අතරමග නවතා තිබූ පුහුණු පාඨමාලාවන් 2016 වසරේදී යළි ආරම්භ කල අතර, වසර අවසන් වන විට සිසුන් 252 ක් පමණ එහි පුහුණු වී ඇති අතර පුහුණුව ලබා අවසන් කර ඇති සිසුන් සියදෙනෙක් සඳහා රැකියා පුහුණු අවස්ථා ලබාදීමට කටයුතු කර ඇත.




තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයෙහි නව පාඨමාලා ආරම්භ කිරීමේ සමාරම්භක උත්සවය
2016.03.20



කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය



තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයෙහි පුහුණු පාඨමාලා සම්පූර්ණ කළ සිසුන් සඳහා සහතිකපත් ප්‍රදානෝත්සවය 2016.04.29



තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයෙහි මෝටර් කාර්මික පුහුණුව ලබා ගනිමින්



# 9. අමාත්‍යාංශය විසින් 2016 වසරේ අත්පත් කර ගන්නා ලද විශේෂ ජයග්‍රහණ

9.1 වැවිලි ප්‍රජාවගේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා වන පස් අවුරුදු (2016 -2020) ජාතික ක්‍රියාකාරී සැලැස්ම එළි දැක්වීම.

9.2 සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම යටතේ පැවති, මූල්‍ය අර්බුද හේතුවෙන් මහාභාණ්ඩාගාර ප්‍රතිපාදන මත සේවක වැටුප් ගෙවන ලද, හැටන් - පූල් බැන්ක් හි පවත්වාගෙන ගිය තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, නෝර්වුඩ් හි පිහිටි ක්‍රීඩා සංකීර්ණය, රම්බොඩ පිහිටි සංස්කෘතික මධ්‍යස්ථානය හා ප්‍රජා ශක්ති මධ්‍යස්ථානයන් අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතට පවරා ගැනීම හා යථාවත් කිරීම.

9.3 ඉන්දියානු රජයේ සහාය යටතේ වතු සේවකයන් සඳහා නිවාස 4000 ක් ඉදි කිරීම සඳහා ඉන්දියානු රජය සමග ගිවිසුමකට අත්සන් තැබීම.

9.4 ජීවනෝපාය සංවර්ධනය සඳහා වන චක්‍රීය අරමුදල නැවත සක්‍රීය කිරීම.

9.5 වැවිලි ප්‍රජාව වෙනුවෙන් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා නව අධිකාරියක් පිහිටුවීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

9.6 ලෝක බැංකු සහාය යටතේ ක්‍රියාත්මක වන පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය සහ පානීය ජල සැපයුම් හා සනීපාරක්ෂක ව්‍යාපෘතීන් අධීක්ෂණය.



අපගේ ජයග්‍රහණයට දායකවන්නෝ





කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය





# 10. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන

## 10.1 වැවිලි මානව සංවර්ධන භාරය

### 10.1.1 පසුබිම

වැවිලි මානව සංවර්ධන භාරය, වැවිලි අංශයේ වෙසෙන ජනතාවගේ ජීවනෝපාය මාර්ග වැඩි දියුණු කිරීම උදෙසා ප්‍රථමයෙන් "වතු නිවාස හා සමාජ සංවර්ධන භාරය" නමින් 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ 1992 සැප්තැම්බර් මස 18 වන දින සංස්ථාපිත කරන ලද සමාගමකි. මෙම ආයතනය පසුව 2002 ඔක්තෝම්බර් මස 25 වන දින "වැවිලි මානව සංවර්ධන භාරය" ලෙස ප්‍රතිනාම ගත කෙරුණු අතර මේ වන විට 2007 අංක දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරනු ලැබ තිබේ.

යථෝක්ත ඉලක්ක සාක්ෂාත් කරගනු පිණිස වැවිලි මානව සංවර්ධන භාරය මගින් පහත දැක්වෙන කටයුතු ක්‍රියාත්මක කරයි.

- වැවිලි ප්‍රජාව සඳහා ලයින් කාමර වෙනුවට ස්වයං අයිතිය සතු තනි නිවාස සුදුසු පුද්ගලයන් වෙත ලබාදීම.
- පැරණි ලයින් කාමර අලුත්වැඩියා කිරීම හා ඒවායේ වහලවල් නැවත සෙවිලි කිරීම (re-roofing).
- ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් ප්‍රවර්ධනය කිරීම.
- ළමා සංවර්ධන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම හා සුදුසුකම් ලත් ළමා සංවර්ධන නිලධාරීන් හඳුන්වා දීම.
- ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (මාර්ග/ ගොඩනැගිලි/ ආගමික මධ්‍යස්ථාන යනාදිය)
- සෞඛ්‍ය පහසුකම් ලබාදීම හා සමාජ සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය
- අලෙවි පහසුකම් කටයුතු සලසා දීම

### 10.1.2 වැවිලි මානව සංවර්ධන භාරය සංවිධාන ව්‍යුහය හා සම්බන්ධිත ආයතන

#### 10.1.2.1 සංවිධාන ව්‍යුහය

වැවිලි මානව සංවර්ධන භාරය, කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. මෙම ආයතනය, වැවිලි අංශයේ දස ලක්ෂයකට අධික ජනතාවගේ ජීවන තත්ත්වය නගාසිටුවීම පිණිස වැඩසටහන් සම්බන්ධීකරණය කරමින්, ඊට අවශ්‍ය පහසුකම් සලසා දීම උදෙසා ක්‍රියාකරන, ශ්‍රී ලංකා රජය, ප්‍රාදේශීය වැවිලි සමාගම් සහ වතු අංශයේ වෘත්තීය සමිති වලින් සමන්විත ත්‍රෛපාර්ශවික සංවිධානයකි.

වැවිලි මානව සංවර්ධන භාරය වතු කම්කරුවන්ගේ යහපත උදෙසා යටිතල හා සමාජ සංවර්ධන වැඩසටහන් රැසක් මෙහෙයවීමෙහිලා රජයේ අදාළ අමාත්‍යාංශ, වෘත්තීය සමිති, ප්‍රාදේශීය වැවිලි සමාගම්, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා වෙනත් දේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය හා පුද්ගලික ආයතන සමග සහයෝගයෙන් කටයුතු කරයි.

ගරු අමාත්‍යතුමා විසින් පත්කරනු ලබන සභාපතිවරයෙකු සහ ශ්‍රී ලංකා රජය, ප්‍රාදේශීය වැවිලි සමාගම් හා වෘත්තීය සමිති නියෝජිතයන්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ වැවිලි මානව සංවර්ධන භාරය ක්‍රියාත්මක වේ. ගාල්ල, රත්නපුර, බදුල්ල, කෑගල්ල, මහනුවර, හැටන් සහ නුවරඑළිය යන ස්ථානවල පිහිටි ප්‍රාදේශීය කාර්යාල හතක් මගින් ප්‍රධාන කාර්යාලයේ කටයුතු ශක්තිමත් කෙරේ. ප්‍රාදේශීය අධ්‍යක්ෂකවරයා අදාළ ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රධානියා වන අතර, තාක්ෂණික මූල්‍ය හා කළමනාකරණ කාර්ය මණ්ඩලය ඔහුට සහාය සලසයි.

**වැවිලි මානව සංවර්ධන භාරයේ ප්‍රාදේශීය ව්‍යුහය.**






### 10.1.2.2 සම්බන්ධිත ආයතන - වතු සේවක නිවාස සමූපකාර සමිතිය

වතු සේවක නිවාස සමූපකාර සමිති, සමූපකාර දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව 1993 වර්ෂයේ දී පිහිටුවන ලදී. මූලික වශයෙන් නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවන ලද මෙම සමිති, මේ වනවිට ප්‍රාදේශීය වැවිලි සමාගම් මගින් පාලනය වන වතුයායවල් 435 ක් ආශ්‍රිතව ක්‍රියාත්මක වේ.

දැනට වතු සේවක නිවාස සමූපකාර සමිති 418 ක් දිවයින තුළ (ප්‍රාදේශීය වැවිලි සමාගම් සහ රජය විසින් පාලනය කරනු ලබන සමාගම් සම්බන්ධිතව) පිහිටුවා ඇත. දැඩි අනුග්‍රහයක් පවතින ප්‍රාදේශීය වැවිලි සමාගම් වල වතුයායවල් ආශ්‍රිතව පිහිටුවා ඇති මෙම සමූපකාර සමිති බොහොමයක්, ප්‍රමුඛ ප්‍රජා මූල සංවිධාන ලෙස රට තුළ ස්ථාපනය වී ඇත. ඒවා වැවිලි මානව සංවර්ධන භාරයේ ප්‍රාදේශීය කාර්යාල වල අධීක්ෂණය යටතේ නිර්ණායක මත පදනම් වූ ඉහළ ශ්‍රේණිගත කිරීම් වලට ලක් කර ඇති අතර, ඒවායේ නිරන්තර සුපරික්ෂාවට භාජනය වේ.

මෙම සමිති "වතු සේවක නිවාස සමූපකාර සමිති (වනිස) බැංකුව" යන නමින් ඔවුන්ගේම බැංකු හරහා සිය අරමුදල් උපදවාගනු ලබන අතර, ණය මුදල් සපයා දීමට ද කටයුතු කරයි.

ණය සැපයීමට අමතරව රැකියා අවස්ථා ද උදා කරමින් වතුවල පදිංචි නිවැසියන් හට ඔවුන්ගේ සේවා අවශ්‍යතා සඳහා පහසු ප්‍රවේශයක් සලසා දෙමින් වතු සේවක නිවාස, සමූපකාර සමිති, සිල්ලර භාණ්ඩ / ශෘහසාධන වෙළඳසැල්, බාබර් සැලුන් හා සන්නිවේදන මධ්‍යස්ථාන යනාදී ව්‍යාපාර ක්‍රියාත්මක කිරීමටද පහසුකම් සලසා ඇත. වතු නිවැසියන්ගේ ජීවන තත්ත්වය, ඔවුන්ගේ සෞඛ්‍ය, පෝෂණය, සනීපාරක්ෂාව හා පවිත්‍රතාව යනාදිය ඉහළ නැංවීම පිණිස ඔවුනට අවශ්‍ය වන භාණ්ඩ හා සේවා පහසුවෙන් ඔවුන් වෙත ළඟාකර දීම සඳහා වතු සේවක නිවාස සමූපකාර සමිති තම උප නියෝජිතයන් ලෙස යොදාගනිමින්, වැවිලි මානව සංවර්ධන භාරය බහු ජාතික සමාගම් සහ වෙනත් ප්‍රමුඛ පෞද්ගලික අංශයේ සංවිධාන සමග ද ඒකාබද්ධව කටයුතු කරයි.

## 10.1.3 මෙම අමාත්‍යාංශය යටතේ වැවිලි මානව සංවර්ධන භාරය විසින් සිදු කරනු ලබන අනෙකුත් ව්‍යාපෘති

### 10.1.3.1 පූර්ව ළමා විය සංවර්ධන වැඩසටහන

ලෝක බැංකු ආධාර යටතේ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය හා එක්ව පූර්ව ළමාවිය සංවර්ධනය සඳහා වන පස් අවුරුදු ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර එහි සමස්ත ආයෝජනය ඇ.ඩො.මි.10 ක් වේ. වැවිලි ප්‍රදේශ ආශ්‍රිතව ජීවත් වන වයස අවුරුදු 3 - 5 අතර දරු දැරියන්ගේ ළමා සංවර්ධන කටයුතු ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව



කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

වැඩි දියුණු කිරීම මෙහි අරමුණ වන අතර, මෙය වසර 2020 දී නිම කිරීමට නියමිතය. මේ යටතේ ගොඩනැගිලි, ක්‍රීඩා පිටි සහ උපකරණ ද සහිතව ඉදිකිරීමට අපේක්ෂිත නව ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව 140 ක් වන අතර, දැනටමත් වැවිලි ප්‍රදේශ තුල ඇති වැඩි දියුණු කිරීමට නියමිත ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව 175 කි. එමෙන්ම අවශ්‍ය උපකරණ ද සහිතව නව ක්‍රීඩා පිටි 175 ක් ඉදිවන අතර දැනට ඉදිකර ඇති ක්‍රීඩා පිටි 210 ක් නවීකරණය සිදු කෙරේ. එමෙන්ම ළමා සංවර්ධන මධ්‍යස්ථානවල ගුරුවරුන් / සහකාර ගුරුවරුන් සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබාදීම ද, දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන්ද මෙයට ඇතුලත් වේ. 2016 වසර තුල වැවිලි ප්‍රදේශ හතක් තුල නව ළමා සංවර්ධන මධ්‍යස්ථාන 28 ක් ඉදිකිරීමට හා මධ්‍යස්ථාන 35 ක් වැඩි දියුණු කිරීමට අවශ්‍ය මූලික කටයුතු අරඹා ඇති අතර ක්‍රීඩාපිටි 42 ක් ඉදිකිරීමට නියමිතය. ළමා සංවර්ධන නිලධාරීන් 206 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් පවත්වා ඇති අතර දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් 49ක් ද පවත්වා ඇත. එමෙන්ම, ප්‍රථම වතාවට ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා එක්ව පෙර පාසැල් ගුරුවරුන් හා ළමා සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ සංගණනයක් ද සිදු කිරීමට කටයුතු කෙරේ.

## 10.1.3.2 ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

ලෝක බැංකු ආධාර යටතේ, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය හා එක්ව වැවිලි මානව සංවර්ධන භාරය විසින් නුවරඑළිය සහ හැටන් හි තෝරාගත් ප්‍රදේශවල ගෘහ ඒකක 15,800 ක ප්‍රතිලාභීන් 63,000ක් ඉලක්ක කොට ගනිමින් ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතීන් 130 ක්ද, ගෘහ ඒකක 7,300 ක ප්‍රතිලාභීන් 29,100 ක් ඉලක්ක කොට ගනිමින් වැසිකිළි ද ඉදි කිරීමට නියමිතය. මෙම ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය ඇ. ඩො. මි. 14 ක් වන අතර, මෙය වසර 2020 දී නිම කිරීමට නියමිතය.

පළමු අදියර තුල මෙම වසර අවසන් වන විට ගෘහ ඒකක 4,352 ක ප්‍රතිලාභ ලබා දෙමින් ජල යෝජනා ක්‍රම 12 ක් නුවරඑළිය, හැටන් සහ මහනුවර ප්‍රදේශයන් ආවරණය කරමින් හඳුනාගෙන ඇත. මේ වන විට ශක්‍යතා අධ්‍යයන කටයුතු නිම කර ඇති අතර මැනුම් කටයුතු සිදු කෙරෙමින් පවතී. වැසිකිළි ඉදිකිරීම සඳහා මූලික කටයුතු අරඹා ඇත.



ජල සම්පාදන ව්‍යාපෘතිය පිළිබඳව ලෝක බැංකු නියෝජිතයන් සමග පැවති සාකච්ඡාව







## 10.1.3.3 ප්‍රජා සෞඛ්‍ය හා සුභසාධන වැඩසටහන

දශක කිහිපයක් මුළුල්ලේ වැවිලි ප්‍රජාව සඳහා සෞඛ්‍ය හා සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතින අතර වැවිලි මානව සංවර්ධන භාරයේ දැක්ම හා මෙහෙවර අනුව යමින් වැවිලි ප්‍රජාව වෙත වඩාත් යහපත් සෞඛ්‍ය තත්ත්වයක් උදා කරවීමටත්, ඔවුන්ගේ කායික, මානසික, ආධ්‍යාත්මික ගුණ වගාව සංවර්ධනය කොට ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහාත් අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීමේ ප්‍රධාන කාර්යභාරය වැවිලි මානව සංවර්ධන භාරය විසින් සිදු කරනු ලබයි. ඒ අනුව, වැවිලි ප්‍රජාවගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වයන්හි කැපී පෙනෙන ප්‍රගතියක් අත්පත් කර දීමේ හැකියාව උදාවී ඇත.





කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

**වතු ප්‍රජාවගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය 2013 - 2015**

| දර්ශකය | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| ජනගහනය | 977,781 | 983,306 | 998,484 |
| ළදරු මරණ | 150 | 133 | 70 |
| මාතෘ මරණ | 15 | 18 | 4 |
| අඩු උපත් බර | 2,792 | 2,103 | 2,083 |
| සජීවී උපත් | 13,319 | 12,312 | 12,028 |
| මළ දරු උපත් | 153 | 133 | 107 |
| **යොවුන් වියේ ගැබ් ගැනීම්** | **969** | **640** | **614** |

**Source: PHDT Annual Health Return - 2016**







## 10.2 සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම යටතේ පැවති ආයතන

### පසුබිම

සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම යටතේ පැවැති, හැටන් - පූල් බැන්ක් හි පවත්වාගෙන ගිය පහත සඳහන්, තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, නෝර්වුඩ් හි පිහිටි ක්‍රීඩා සංකීර්ණය, රම්බොඩ පිහිටි සංස්කෘතික මධ්‍යස්ථානය හා ප්‍රජා ශක්ති මධ්‍යස්ථානයන්, අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ 2016.07.20 දින සිට මෙම අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතට පවරා ගෙන ක්‍රියාත්මක කරනු ලබයි.

### 10.2.1 හැටන්- පූල් බැන්ක් හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය

වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ පැවැති මෙම පුහුණු මධ්‍යස්ථානය 2007 වර්ෂයේ මාර්තු මාසයේදී සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනමෙහි කළමනාකාරීත්වය යටතට පවරා ගෙන තිබිණි. ශ්‍රී ලංකාවේ පිහිටි ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය හරහා ඉන්දියානු රජයේ මූල්‍ය අනුග්‍රහය යටතේ විශේෂඥ පුහුණුකරුවන් 07 දෙනෙකුගේ සේවය එවකට මෙම ආයතනය වෙත ලබා දී ඇති අතර ඉන් 04 දෙනෙකුගේ සේවය තව දුරටත් ලැබෙමින් පවතී. ඇතැම් පාඨමාලාවන් දේශීය පුහුණුකරුවන්ගේ මග පෙන්වීම යටතේ සිදු කරනු ලබයි. තොණ්ඩමාන් අනුස්මරණ පදනම මුහුණ පා තිබූ මූල්‍ය අර්බුදය හේතුවෙන් පසුගිය වසර තුළ එහි පාඨමාලාවන් ක්‍රමවත්ව පවත්වා ගැනීම අසීරුව තිබූ නමුත් අමාත්‍යාංශය විසින් ලබා දුන් මූල්‍ය ප්‍රතිපාදන යටතේ 2016 වසරේ නැවත එම පාඨමාලාවන් ආරම්භ කිරීමට අවස්ථාව උදා විය. ඒ අනුව, 2016 මාර්තු මස 10 දින පාඨමාලාවන් නැවත ආරම්භ කිරීමට කටයුතු කර ඇති අතර 2016 වසරේ විවිධ පුහුණු පාඨමාලාවන් සඳහා මේ දක්වා ලියාපදිංචි කර ගෙන ඇති සිසුන් සංඛ්‍යාව 252 කි. මාස 04 ක පුහුණු කාලය සම්පූර්ණ කරන ලද (මාර්තු- ජූනි) සිසුන් සංඛ්‍යාව 59 කි. ඉන් 44 දෙනෙකු රැකියාවේ නිරතව පුහුණු වීමේ අවස්ථාවන් උදා කරගෙන ඇත. මීට අමතරව, වසර 02 කට පසුව, මේ දක්වා පුහුණු පාඨමාලාවන් සම්පූර්ණ කර තිබූ සිසුන් 457 දෙනෙකු සඳහා සහතිකපත් ප්‍රදානය කිරීම 2016 අප්‍රේල් මස 29 දින සිදුකරන ලදී.

වෘත්තීය පුහුණුවට අමතරව තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය මගින් පාසැල් ළමුන්ගේ අමතර දැනුම වර්ධනය කිරීමේ අවස්ථාවද උදා කර දී ඇත. අ.පො.ස (උ /පෙළ) විෂයධාරාවට අලුතින් ඇතුළත් කර ඇති ඉංජිනේරු තාක්ෂණික විෂයය සඳහා දෙමළ මාධ්‍යයෙන් පන්ති පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර ඒ අනුව නෝර්වුඩ්, කොටගල, බදුල්ල, මාතලේ හා පුස්සැල්ලාව ප්‍රදේශයන්හි පාසල් සිසුන් වෙත එම පුහුණු අවස්ථාව හිමි වී ඇත. අ.පො.ස (උ /පෙළ) විභාගයෙන් දිස්ත්‍රික් ප්‍රථම ස්ථානය හිමි කර ගැනීමට එහි පුහුණුව ලැබූ නෝර්වුඩ් දෙමළ මහ විද්‍යාලයේ ශිෂ්‍යයෙකු සමත් වීම විශේෂ සිදුවීමක් ලෙස සැලකිය හැක. එසේම, අවට පාසැල් රාශියක අ.පො.ස (සා/පෙළ ) සිසුන් ද ඔවුන්ගේ විද්‍යා විෂය දැනුම හා තාක්ෂණික හැකියාවන් වර්ධනය කිරීම සඳහා මෙම ආයතනය වෙත යොමු කරනු ලැබේ.



කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

## 2016 වසරේ පූල් බැන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය යටතේ විවිධ පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි වීම

| අංක | පාඨමාලා | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මාර්තු - දෙසැම්බර් 2016 | | | මාර්තු - ජූනි 2016 | | | ජූලි - දෙසැම්බර් 2016 | | |
| | | පි | ගැ | එ | පි | ගැ | එ | පි | ගැ | එ |
| 1 | මෝටර් කාර්මික | 12 | - | 12 | - | - | - | - | - | - |
| 2 | විදුලි කාර්මික ශිල්පී | 14 | - | 14 | - | - | - | - | - | - |
| 3 | කාර්මික ශිල්පී | 13 | - | 13 | - | - | - | - | - | - |
| 4 | ගුවන් විදුලි, රූපවාහිනී අලුත්වැඩියාව | 6 | - | 6 | - | - | - | - | - | - |
| 5 | ඇලුමිනියම් ෆැබ්රිකේටර් | - | - | - | 13 | 0 | 13 | 10 | 0 | 10 |
| 6 | ඇඳුම් මැසීම | - | - | - | 0 | 16 | 16 | 0 | 16 | 16 |
| 7 | ගෘහස්ත විදුලි කාර්මික | - | - | - | 5 | 5 | 10 | 12 | 2 | 14 |
| 8 | හෝටල් කළමනාකරණය | - | - | - | 10 | 2 | 12 | 17 | 2 | 19 |
| 9 | තොරතුරු සන්නිවේදන හා තාක්ෂණය | - | - | - | 2 | 17 | 19 | 7 | 11 | 18 |
| 10 | මෝටර් සයිකල් කාර්මික | - | - | - | 13 | - | 13 | 22 | 0 | 22 |
| 11 | පැස්සුම් ශිල්පය | - | - | - | 1 | - | 13 | 6 | 0 | 6 |
| 12 | වඩු කාර්මික | - | - | - | 6 | - | 6 | - | - | - |
| එකතුව | | 45 | - | 45 | 62 | 40 | 102 | 74 | 31 | 105 |
| | | 252 | | | | | | | | |





### 10.2.2 ප්‍රජාශක්ති (ඊ කියෝස්ක්) මධ්‍යස්ථාන

තොරතුරු සන්නිවේදන තාක්ෂණය පෘථුල ලෙස භාවිත කරමින් අඩු වරප්‍රසාදලත් ජන කොටස් සඳහා පූර්ණවූත්, විස්තීර්ණවූත් සමාජ ආර්ථික සංවර්ධනයක් හිමිකරදීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. 2006 වසරේ අප්‍රේල් මාසයේදී වනරාජා වතුයායේ ප්‍රථම ප්‍රජා ශක්ති මධ්‍යස්ථානය පිහිටුවන ලද අතර මේ වන විට නවීන තාක්ෂණික පහසුකම් වලින් යුක්ත ප්‍රජා ශක්ති මධ්‍යස්ථාන 44 ක් ක්‍රියාත්මකව පවතී. ඒ අනුව, වැවිලි ප්‍රජාවගේ අධ්‍යාපනික, සමාජයීය හා සංස්කෘතික ක්‍රියාකාරකම් පිළිබඳව ඒකාබද්ධතාවක් පවත්වා ගනිමින් තොරතුරු තාක්ෂණය ඔස්සේ වැවිලි ප්‍රජාව තුළ තාක්ෂණික පරිණාමයක් ඇති කිරීම මේ හරහා සිදුවේ. දිවයින පුරා පිහිටි ප්‍රජා ශක්ති මධ්‍යස්ථාන 44 ක් තුල 2016 වසරේ ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව 3004 ක් වේ.



## මෙම වැඩසටහන් වලට අමතරව ප්‍රජා ශක්ති මධ්‍යස්ථාන හරහා 2016 වසර තුලදී පහත සඳහන් ප්‍රජා සහභාගීත්ව වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

- වතු ප්‍රජාවගේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා සකස් කරන ලද පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් 30 ක් හැටන්, නුවරඑළිය, බදුල්ල, මහනුවර, ගාල්ල හා රත්නපුර යන ප්‍රදේශයන් හි පැවැත්වීම.
- ජාත්‍යන්තර යොවුන් දිනය සැමරීමේ වැඩසටහන
- පාසල් ළමුන් සඳහා නිපුණතා සංවර්ධන වැඩසටහන්
- යෝග අභ්‍යාස පිළිබඳ වැඩමුළු
- වතු වෛද්‍ය නිලධාරීන් හා එක්ව ස්වස්ථතාව පිළිබඳ වැඩසටහන්
- ප්‍රාථමික අධ්‍යාපන වැඩසටහන්
- කාන්තා දිනය සැමරීමේ වැඩසටහන
- ස්වයං රැකියා පිළිබඳ වැඩමුළුව (අත් බෑග් සැකසීම)
- ජාත්‍යන්තර මව්වරුන්ගේ දිනය සැමරීම
- සෞඛ්‍ය හා ළමාරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්
- ආසාදන රෝග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්
- ළමා දිනය සැමරීමේ වැඩසටහන











කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

## 10.2.3 තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය - රම්බොඩ

අඩු පහසුකම් සහිත ප්‍රජාවගේ සංස්කෘතික හා කලා කුසලතාවන් වර්ධනය කිරීමේ අරමුණින් මෙම මධ්‍යස්ථානය ආරම්භ කරන ලදී. ගුරුවරයෙකුගේ අධීක්ෂණය යටතේ පූර්ණ කාලීනව කර්ණාටක සංගීතය, වීණා වාදනය, මෘදංගය හා වයලින් වාදන පුහුණුව ලබා දීම මෙහිදී සිදු කෙරේ. තොණ්ඩමාන් අනුස්මරණ පදනම මුහුණ පෑ මූල්‍ය අර්බුද හේතුවෙන් ඉහත වැඩසටහන් අඛණ්ඩව සිදුකිරීමට නොහැකි වී ඇත. ඒ අනුව 2016 වසරට අදාලව මෙම මධ්‍යස්ථානය තුළින් කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් ලැබී නොමැත.

## 10.2.4 නෝර්වුඩ්හි පිහිටි ක්‍රීඩා සංකීර්ණය - නෝර්වුඩ්

2005 අංක 19 දරණ පාර්ලිමේන්තු පනත මගින් මෙම ක්‍රීඩාංගණය සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම වෙත පවරා දී ඇති අතර ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය මගින් 2011 වසරේදී රු: මි. 25 ක මුදලක් වැය කර එහි ක්‍රීඩා පිටිය සංවර්ධනය සිදු කර ඇත. එහි ක්‍රීඩාංගණය හා ගෘහස්ත බැඩ්මින්ටන් පිටිය 2012 වසරේදී විවෘත කර ඇත. තොණ්ඩමාන් පදනම මුහුණ දී තිබූ මූල්‍ය අර්බුද හේතුවෙන් ක්‍රීඩාගාරයේ සංවර්ධනය කිරීම් තවදුරටත් සිදුකිරීමට 2016 වසරේ හැකියාවක් නොලැබූ නමුත් අවට ප්‍රදේශයේ පාසල් හා රාජ්‍ය ආයතන විසින් විවිධ ක්‍රීඩා තරග හා ක්‍රියාකාරකම් පැවැත්වීම සඳහා 2016 වසර පුරා මෙම ක්‍රීඩාගාර සංකීර්ණය යොදා ගැනීමට කටයුතු කර ඇත.



නෝර්වුඩ්හි පිහිටි ක්‍රීඩා සංකීර්ණය



වැවිලි අංශය රටේ සංවර්ධනය සහතික කිරීමෙහිලා දයක වන ප්‍රධාන අංශයකි. එසේ වුවද විශේෂයෙන් දරිද්‍රතාව, සෞඛ්‍ය හා පෝෂණය, පූර්ව ළමාවිය රැකවරණය, අධ්‍යාපනයට ප්‍රවේශය, සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය, සනීපාරක්ෂාව සහ කාන්තා බලගැන්වීම යනාදී කරුණු සම්බන්ධයෙන් නාගරික හා ග්‍රාමීය අංශයන්හි දර්ශක හා සසඳන කළ වැවිලි අංශයේ වෙසෙන ජනතාව එවැනි පහසුකම්වලින් වඩාත් පීඩිත ජන කොට්ඨාශය ලෙස සැලකේ. මෙම ගැටලු නිරාකරණය කර ඔවුන්ගේ ජීවන මට්ටම ඉහල නැංවීමේ අරමුණින් රජය විසින් මෙම අමාත්‍යාංශය ස්ථාපිත කරන ලදි.

பெருந்தோட்டத்துறை நாட்டின் அபிவிருத்தியை உறுதிப்படுத்துவதில் பங்களிப்புச் செய்யும் பிரதானமான ஒரு துறையாகும். எனினும், குறிப்பாக வறுமைநிலை, ஆரோக்கியமும் போசாக்கும், முன்சிறுவர் பராய பாதுகாப்பு, கல்விக்கான வாய்ப்பு, பாதுகாப்பான குடிநீர், சுகாதாரம், மகளிர் வலுவூட்டல் முதலிய விடயங்கள் தொடர்பில் நகர மற்றும் கிராமிய துறைகளின் குறிகாட்டிகளுடன் ஒப்பிடுமிடத்து பெருந்தோட்டத்துறை வாழ் மக்கள் அவ்வாறான வசதிகளினால் பெரிதும் பலவீனமடைந்த மக்களாக கருதப்படுகின்றனர். ஆகவே இப்பிரச்சினைகளை நிவர்த்தி செய்து அவர்களின் வாழ்நிலையை முன்னேற்றும் நோக்கிலேயே அரசாங்கத்தினால் இவ்வமைச்சு தாபிக்கப்பட்டது.

The plantation sector is one of the main sectors contributing for the assurance of country's development. However, the plantation community is the most deprived community in terms of social development when compared with urban and rural sector indicators particularly on poverty, health and nutrition, early childhood care, access to education, safe drinking water, sanitation and women empowerment. In addressing the above issues, this Ministry was set up by the Government focusing on improving their living standards.


කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு மற்றும் சமூக அபிவிருத்தி அமைச்சு

**Ministry of Hill Country New Villages, Infrastructure and Community Development**